**Abstract No: MDS 09** **Multidisciplinary Studies**

# ඉතිහාසය විෂය සඳහා නිපුණතා පාදක ඉගැන්වීමේ ක්‍රම පන්ති කාමරය තුළ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

**ඩී. විජේසේකර[1*]**

[1]පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, කළුතර, ශ්‍රී ලංකාව

අධ්‍යාපනයේ අරමුණක් වන්නේ බුද්ධිමත්, සදාචාරාත්මක, චිත්තවේගීය හා කායික යන අංශ සියල්ලේම සාමකාමී සංග්‍රහයක් මගින් සමබර පෞරුෂයක් ඇති පරිපූර්ණ පුද්ගලයෙකු තැනීමය. එවැනි පුද්ගලයෙකු ළඟා කරගත යුතු නිපුණතා පාසල් අධ්‍යාපනයෙන් ලබාදීම වර්තමාන අධ්‍යාපනයේ කාර්යභාරයකි. එබැවින් කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල නිපුණතා ක්‍රියාත්මක වන ආකාරය විමසීමේ අරමුණින් *10 ශ්‍රේණිය ඉතිහාසය විෂයමාලාවට අදාළව* මෙම පර්යේෂණය ක්‍රියාත්මක කෙරිණි. එහිදී විෂයමාලාවේ ක්‍රියාත්මක මට්ටම සහ ශිෂ්‍යයන් එම නිපුණතා සාධනය කරගැනීම යනාදී කරුණු හඳුනාගැනීම අවශ්‍ය විය. ඒ සඳහා *ඉතිහාසය විෂයයෙහි නිපුණතා ක්‍රියාත්මක කිරීම පිළිබඳ විවිධ පාර් ශ්වයන්ගේ අදහස් විමසාබැලීම, ඉතිහාසය විෂයට භාවිත කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම ශිල්ප විමසීම, ඉතිහාසය විෂයෙහිදී ශිෂ්‍ය නිපුණතා වර්ධනයට යොදන උපාය මාර්ග හඳුනාගැනීම, ඉතිහාසය විෂය සඳහා නිපුණතා මූලික ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය සිදුවන ආකාරය සොයාබැලීම* යන අරමුණු ඔස්සේ පර්යේෂණය සිදු කරන ලදී. *ඓතිහාසික පර්යේෂණ ප්‍රවේශය මෙන්ම විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය* ද, ජනගහනයෙන් කොටසක් අධ්‍යයනය කරන නිසා *නියැදි සමීක්ෂණ ක්‍රමවේදය* ද අධ්‍යයනයට උචිත ආකාරයෙන් යොදාගෙන තිබේ. *ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ෂෙඩ්‍යුල යන මිනුම් උපකරණ* භාවිතයෙන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ සිසුන් 230ක නියැදියක් මෙන්ම පන්ති කාමර නිරීක්ෂණ 12ක් මගින් මේ සඳහා දත්ත රැස් කෙරිණි. එමගින් ලැබුණු ප්‍රතිචාර, අධ්‍යනයට යොදාගත් අරමුණු මත පදනම්ව, අන්තර් පරිමාණ විශ්ලේෂණ ක්‍රම යටතේ MS – Excel භාවිතයෙන් ප්‍රතිශතක වගු හා සංඛ්‍යාත්මක ක්‍රම යොදමින් විශ්ලේෂණය කර තිබේ. එමගින් කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ඉතිහාසය විෂයෙහි නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාකාරී වන ගැටලු පවතින බව, විෂයමාලා ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ගුණාත්මක වෙනස අධ්‍යාපන ක්ෂේත්‍රයට නියමාකාරයෙන් ලැබී නොමැති බව, නිපුණතා සාධනයට යොදන ගුරු උපාය මාර්ගවල සාධනීය ලක්ෂණ දැකිය හැකි වුවද, ක්‍රියාත්මක මට්ටමේ දුර්වලතා පවතින බව, විෂයමාලාව දැඩිලෙස ශාස්ත්‍රීය අංශයට නැඹුරු වී ඇති අතර නිපුණතා වර්ධනයට ඇත්තේ සීමිත අවස්ථා බව අනාවරණය විය. එම අනාවරණ අනුව ඉතිහාසය විෂයෙහි අපේක්ෂිත නිපුණතා සාධනයට පවතින විෂයමාලාව සංශෝධනය කළ යුතු බවත්, නිපුණතා ලබාදීමේ අවශ්‍යතාවය පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බන්ධ සියලු පාර්ශ්වයන් දැනුවත් වියයුතු බවත්, ශිෂ්‍ය නිපුණතා සාධනය, ඇගයීම සහ ප්‍රතිකාර්ය වැඩසටහන් අධීක්ෂණය ක්‍රමවත් වියයුතු බවත්, නිපුණතා සාධනයට ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් වාතාවරණයක් අත්‍යවශ්‍ය බවත් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද:** ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, ඉතිහාසය, නිපුණතා

* dwdeshani@gmail.com